DOI: 10.31357/fhssmst.2004.00013

# 1950 දශකයේ අවසානය තෙක් ගුවන්විදුලි සරල ගියේ ගමන් මග පිළිබඳ විමර්ශනයක්

කුළුගම්මන රන්කැත්තේ ගෙදර ප්‍රියන්ත තිලකසිරි

ලියාපදිංචි අංකය GS/HU/1161/2001

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති (සිංහල) උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධය

අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම නිබන්ධයට අදාළ පර්යේෂණ කටයුතු ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න මහතාගේ උපදේශකත්වය යටතේ සිදු කළ බව ද, සමස්ත නිබන්ධය හෝ එයට අයත් කොටසක් හෝ කිසි ම අයුරකින් වෙනත් විශ්වවිද්‍යාලයක/ආයතනයක පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් කොට නැති බව ද ප්‍රකාශ කරමි.

07.10.04

දිනය

අයදුම්කරු

## උපදේශකගේ සහතිකය

අයදුම්කරු විසින් ඉහත සඳහන් කරන ලද ප්‍රකාශය සත්‍යය බව ද, ඇගයීම සඳහා මෙම නිබන්ධය විශ්වවිද්‍යාලය වෙත ඉදිරිපත් කිරීමට සුදුසු බව ද සහතික කරමි.

....04/10/07.... ........................

දිනය උපදේශක

16 MAY 2006

# 1950 දශකයේ අවසානය තෙක්

# ගුවන්විදුලි සරල ගීයේ

# ගමන් මග පිළිබඳ විමර්ශනයක්

# පිදුම

ඇඟිලි තුඩින් පන්හිඳ ගෙන
මහ ගල් කුළු වුව ද හඬන
කවිකම් කළ
ඒ කවිකම්
සරු සැරියේ මීයැසියෙන්
සිත්තම් කළ
සුම්හිරි සුවඳැති මල් උදෙසා.

# උපකාරානුස්මෘති

- මෙම පර්යේෂණය සඳහා උපදේශක වශයෙන් ක්‍රියාකරමින් එහි ඉදිරි ගමන සඳහා මග පෙන්වූ මෙන් ම ප්‍රයෝගික ව අධ්‍යයන ගැටලු ඇති වූ විටෙක එම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා උපකාර කළ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න මහතාට.

- ශාස්ත්‍රපති ප්‍රථම වර්ෂයේ පරීක්ෂණ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා පර්යේෂණ ක්‍රමවේදය හා එම පාඨමාලාවට අයත් අනෙකුත් විෂයයන් පිළිබඳ දැනුම ලබා දුන් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිස්ස කාරියවසම් මහතාට.

- භාෂා ව්‍යාකරණ ගැටලු මතු වූ අවස්ථාවල හා පර්යේෂණය සිදුකරගෙන යාමේදී විෂයානුබද්ධ කරුණු පහදා දීමෙන් මා දැනුවත් කළ හා දිරිමත් කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ අධ්‍යයනාංශ ප්‍රධාන ආචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ මහතාට.

- ව්‍යාකරණ දොස් පැහැදිලි කොට නිවැරදි කර දීම සඳහා ක්‍රියා කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ කථිකාචාර්ය මීපිටියේ සීලරතන හිමියන්ට හා සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී කුසුමලතා ලංකාමුල්ල මහත්මියට.

- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ තැටි ගබඩාව පරිශීලනය කිරීම සඳහා අවසර ලබා දුන් එහි ගරු සභාපතිතුමාට හා සංගීත අංශයේ පාලකතුමාට.

- මෙම පර්යේෂණයේ දී ඉමහත් සහයෝගයක් ලබාදුන් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා සිංහල තැටි ගබඩාවේ තැටි ගබඩා පාලක වශයෙන් ක්‍රියා කරන ඒ. එම්. චන්ද්‍රදාස

බණ්ඩාර මහතාට හා එම තැටි ගබඩාවේ පී. ඩබ්ලිව්. සී. විතාරණ මහත්මිය ඇතුළු කාර්ය මණ්ඩලයට.

- අධ්‍යයන කටයුතුවලට අදාළ විවිධ පොත් හා ලේඛන සපයා දෙමින් උපකාර කළ සුභද්‍රාරාම විද්‍යායතනයේ පූජ්‍ය ගන්තුනේ සෝමතිලක හිමියන්ට හා එම විද්‍යායතනයේ පුස්තකාලයාධිපති මහනාම පානමුල්ල මහතාට.

- සෞන්දර්ය විශ්වවිද්‍යාලයයේ සංගීත අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහානාම වික්‍රමසිංහ සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය බී. ආර්. දසනායක යන මහත්වරුන්ට.

- විවිධ අවස්ථාවල පර්යේෂණය පිළිබඳ තොරතුරු විමසමින් අවශ්‍ය උපදෙස් සපයා දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ සමාජවිද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතාට.

- සම්මන්ත්‍රණ පත්‍රිකා ඉදිරිපත් කිරීමේ දී ඉතා කැපවීමකින් කටයුතු සම්පාදනය කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රදීප් රත්නායක මහතාට.

- අවශ්‍ය කරුණු හින්දි භාෂාවෙන් සිංහල භාෂාවට පරිවර්තනය කරදුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ කථිකාචාරිනී නිලන්ති රාජපක්ෂ මහත්මියට හා කථිකාචාරිනී වජිරා ගුණසේන මහත්මියට.

- සම්මන්ත්‍රණ පත්‍රිකා ඉදිරිපත් කිරීමේ දී විවිධ අයුරින් සහය දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ කථිකාචාර්ය නුවන් විතානගේ මහතාට සහ කථිකාචාරිනී හිමාලිකා රණවීර මහත්මියට.

- සම්මන්ත්‍රණ පත්‍රිකා ඉදිරිපත් කිරීමේ දී පැන නැගුණු ඇතැම් ප්‍රායෝගික ගැටලු නිරාකරණය කර දෙමින් කැපවීමකින් යුතු ව උපකාර කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භෞතිකවිද්‍යා අධ්‍යයනාංශයේ කථිකාචාර්ය පි. මධුරංග ප්‍රනාන්දු මහතාට.

- විවධ අවස්ථාවල පර්යේෂණයට අදාළ කරුණු රසවින්දනාත්මක සාකච්ඡාවකට භාජනය කොට අදහස් ලබා දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිනී මනෝරි මනම්පේරි මහත්මිය හා එහි අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මංජුලා වීරසිංහ මහත්මියට.

- පර්යේෂණය සඳහා කාලය ලබා ගැනීමේදී මා වෙනුවෙන් තම කාලය හා ශ්‍රමය කැප කළ දයාබර බිරිඳ සුදීපාට.

- රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමිය ඇතුළු කාර්යමණ්ඩලයේ සැමට.

- රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පුස්තකාලයාධිපතිනියට හා ආචාර්ය නන්දන කරුණානායක මහතාට.

- කොළඹ කෞතුකාගාර පුස්තකාලයේ කාර්යමණ්ඩලයට.

- මුද්‍රණ කටයුතු සඳහා උපකාර කළ කාන්ති ගුණවර්ධන මහත්මියට හා විජේරාම "D.M.I. Communications" ආයතනයට.

- භාෂා හා සංස්කෘතික අධ්‍යනාංශයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඩබ්ලිව්. එම්. ලක්ෂ්මන් මහතාට.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ පශ්චාද් උපාධි පීඨයේ පීඨාධිපතිතුමිය ඇතුළු කාර්යමණ්ඩලයට.

# පටුන


පිදුම V

උපකාරානුස්මෘති VI-IX

පටුන X

හැඳින්වීම XI-XVI

**පළමු පරිච්ඡේදය**

සරල ගීය 1 - 21

**දෙ වන පරිච්ඡේදය**

ගුවන්විදුලි සරල ගීය හා බැඳි ඉතිහාසය (1925-1959) 22 - 77

**තෙ වන පරිච්ඡේදය**

ගීත පද රචනය 78- 97

**සිව් වන පරිච්ඡේදය**

ගුවන්විදුලි සරල ගීයේ සංගීත නිර්මාණය 98 - 134

**සමාලෝචනය** 135- 140

**ග්‍රන්ථ නාමාවලිය** 141 - 152

**සූචිය** 153 – 158

# හැඳින්වීම

ලංකා ගුවන්විදුලි සේවය මගින් ප්‍රචාරය කළ ගීත අතර එක්තරා කොට්ඨාසයක් 1950 දශකය මුල් භාගයේ දී සරල ගී නමින් හඳුන්වන්නට යෙදිණි. මෙම පර්යේෂණය සඳහා විෂය වන්නේ එම ගීත කොට්ඨාසය යි.

අධ්‍යයන විෂයය සීමා කොට ඇති කාල පරාසය 1925 -1959 අතර වේ. එම කාල අන්තරය නියමනය කිරීම ගුවන්විදුලි සරල ගී විමර්ශනය සඳහා සිදු කළ සාහිත්‍යාන්වේෂණයේ දී (literature survey) නිරීක්ෂණය කළ විශේෂ කරුණු හේතු කොට ගෙන සිදු කැරිණි. එම කරුණු පහත දැක්වේ.

1. එම කාල අන්තරය තුළ වූ ලංකාවේ ගුවන්විදුලි සරල ගීය ආශ්‍රිත කරුණු විධිමත් අධ්‍යයනයකට ලක් වී නො තිබීම.
2. සිංහල සංගීත ක්ෂේත්‍රයේ පුරෝගාමී මෙන් ම ප්‍රචලිත සංගීතවේදීන්, ගායන ශිල්පීන් හා ගායන ශිල්පිනියන් වැඩි ප්‍රමාණයක් එම කාලය අතරතුර බිහි වීම.
3. ලංකාවේ නො නැසී පවතින ගීත නිර්මාණ අතර සැලකිය යුතු ප්‍රමාණයක් එම කාලය අතරතුර ගුවන්විදුලි සේවය හරහා බිහි වූ ගීත වීම.

සරල ගී යන යෙදුමෙන් බැහැර වෙනත් නම්වලින් හැඳින්වෙන ගීත විශේෂයෝ ද ගුවන්විදුලි සිංහල තැටි ගබඩාවේ තැටිවල අන්තර්ගත වෙත්. ජන ගී, නාඩගම් ගී, නූර්ති ගී, බයිලා කපිරිඤ්ඤා, චිත්‍රපට ගී, ළමා ගී හා ගීත නාටක ගී, එම ගීත විශේෂයන් ය. ග්‍රැමෆෝන් තැටි ගීත ද ඒ අතර වේ. මෙකී ගීත පිළිබඳ අධ්‍යයනයක් මෙම පර්යේෂණයේ දී සිදු නො කැරේ. 1950 දශකයේ අවසානය දක්වා ගුවන්විදුලි සරල ගීයේ ගමන් මග විමර්ශනය කිරීමේ දී විෂය කොට ගන්නා ගීත ප්‍රධාන වශයෙන් සපුරා තිබිය යුතු අවශ්‍යතා පහත සඳහන් වේ.

විමර්ශනය කිරීමේ දී විෂය කොට ගන්නා ගීත ප්‍රධාන වශයෙන් සපුරා තිබිය යුතු අවශ්‍යතා පහත සඳහන් වේ.

(i) "LS" ලකුණ යටතේ අගල් 16 සහ අගල් 12 තැටිවල අන්තර්ගත වීම.

(ii) ලංකා ගුවන්විදුලියේ ජාතික සේවය මගින් පමණක් නිෂ්පාදනය වූ විවිධ ප්‍රසංග, සරල ගී යන වැඩසටහන්වලට අයත් වීම.

(iii) පද රචනය, තනුව, සංගීත නිර්මාණය යන කරුණු නව නිර්මාණ වීම.

LS යන ලකුණින් අදහස් වන්නේ "ලයිට් සෝං" (Light Song) යන්න බව ඇතැම් තැනෙක සඳහන් වේ. "ලයිබ්‍රරි සිංහලීස්" (Library Sinhalese) යනු ඒ හා බැඳි තවත් අර්ථකථනයකි. LS යන අක්ෂර "ලයිට් සෝං" යන්නට කෙටි යෙදුමක් සේ යෙදිය හැකි නමුත් අදාළ තැටිවල ධර්මදේශනා, වාර්තා, දේශන, ශාස්ත්‍රීය සංගීතය ආදී විවිධ විෂයයන්ට අයත් වැඩ සටහන් ද පවති.

ගුවන් විදුලියේ තැටිගත කළ ගීත අතුරින් අද අසන්නට ලැබෙන්නේ 1946 සහ ඉන් මෙ පිට තැටිගත වූ ගීත යි. 1946 - 1950 අතර කාලයේ ගීත අද පවතින්නේ 1950 න් මෙ පිට පැරණි තැටිවලින් ලබා ගත් පිටපත් වශයෙනි. 1950 වර්ෂයට අයත් සිංහල ගීත ඇතුළත් පැරණි ම තැටිය ලෙස අද සිංහල තැටි ගබඩාවේ පවතින්නේ අංක LS 16/10 ( සුනිල් සාන්ත - පල බර බක් මාසේ) දරන තැටිය යි. තැටි සියයට අනුඅටක පමණ තැටිගත කිරීම් හා සම්බන්ධ විස්තර සටහන් නො වේ. එබැවින් අදාළ කාල පරාසයට අයත් තැටි අංක නිශ්චිත වශයෙන් ප්‍රකාශ කළ නො හැකි ය. ඇත්තේ ඒ පිළිබඳ ආසන්න නිගමනයකට එළැඹීමේ හැකියාවකි. දින සඳහන් තැටිවලින් උපුටා ගත් තොරතුරුවලින් සමහරක් පහත දැක්වේ.

| තැටි අංකය | තැටිගත කළ දිනය |
|---|---|
| LS 16 102,103 | 1950.11.05 |
| LS 16 110 | 1950.11.17 |

| | |
|---|---|
| LS 16 119 | 1950. 11.27 |
| LS 16 156 | 1951.01.19 |
| LS 16 319 | 1951.06.23 |
| LS 16 925 | 1951.12,17 |
| LS 16 1724 | 1952.10.19 |
| LS 16 4779 | 1957.09.23 |
| LS 16 5337 | 1958. 09.19 |
| LS 16 5700 | 1959. 09.23 |
| LS 16 5842 | 1960.02.29 |

1959 අවසාන භාගයට අයත් LS 16/5700 අංක දරන තැටියේ සඳහන් දිනය වන 1959.09.23 හා 1960 මුල් භාගයට අයත් LS 16/5842 අංක දරන තැටියට අයත් දිනය වන 1960.02.29 සංසන්දනය කොට දළ වශයෙන් LS 16/5800 තැටිය 1959 වර්ෂයේ අවසාන සීමාව ලෙස උපකල්පනය කැරේ.

මූලික පර්යේෂණ ගැටලුව ගොඩ නැගෙන්නේ සරල ගිය යනු කුමක් ද යන්න මත යි. ගැටලුවට අයත් විෂයයේ භාව මූලික ස්වරූපය අනුව කල්පිතයක් ගොඩනැගීමේ අසීරුතාවක් පවතී. ගුවන්විදුලි සරල ගීයේ ආකෘතිය කුමන සංගීත ක්‍රමයක් මුඛ්‍ය කොට පවතින්නේ ද යන්න තවත් ගැටලුවකි. මෙකී කාරණා විමර්ශනය කිරීම සඳහා සරල ගීතයට අයත් ඓතිහාසික තොරතුරු අධ්‍යයනය කළ යුතු වේ.

ඒ අනුව මෙම පර්යේෂණයේ අරමුණු ගොඩනැගෙන්නේ සරල ගිය යනු කුමක් ද යන ගැටලුවට විසඳුම් සෙවීමත්, ගුවන්විදුලි සරලගීයේ සංයුතිය, අනන්‍යතාව හා ඒවා ගොඩ නැගීමට අදාළ වූ ඉතිහාසය අධ්‍යයනය කිරීමත් යන කරුණු මත යි.

**අධ්‍යයන අරමුණු**

i. සරල ගිය යනු කුමක් ද යන ගැටලුවෙහි විසඳුම් කරා යොමු වීම.

ii. ගුවන්විදුලි සරල ගි නිර්මාණය සඳහා දායක වූ පුරෝගාමී මානව සම්පත් හඳුනා ගැනීම.

iii. ගුවන්විදුලි සරල ගියෙහි ගුණාත්මක ලක්ෂණ හඳුනා ගැනීම.

iv. අද්‍යතන ගීත ක්ෂෙත්‍රය හා සැසඳීමේ දී අඩසියවසකට වැඩි කාලයක් තුළ සිංහල ගීතය ආශ්‍රිත නිර්මාණාත්මක චින්තනයේ ප්‍රගමනය හෝ බිඳවැටීම හෝ පිළිබඳ සියුම් ව විමසා බැලීම සඳහා මූලාශ්‍රය සැපයීම.

මෙම අරමුණු ඔස්සේ පර්යේෂණය සැලසුම් වූයේ ප්‍රධාන කරුණු තුනකට අනුව ය.

i. සරල ගිය යනු කුමක් ද යන්නට විසඳුම් සෙවීම.

ii. ගුවන්විදුලි සරල ගියේ ඉතිහාසය අධ්‍යයනය කිරීම.

iii. එහි ගුණාත්මක ලක්ෂණ අධ්‍යයනය කිරීම.

පළමු පරිච්ඡේදයේ දී සරල ගිය යනුවෙන් ගීතය හඳුන්වා දීමට පාදක විය හැකි කරුණු සාකච්ඡා කැරේ. ගියක් සරල වන්නේ කෙසේද යන්න එහිදී පැන නගින ගැටලුවකි. මෙම කාරණය රස (Sentiment) හා භාව (Emotions) යන හැඟීම් මත පදනම් වන බැවින් විසඳුම් සෙවීම විද්‍යාත්මක ක්‍රමවේදයක් මත සිදු කිරීමේ හැකියාක් නො පවතී. එහෙත් සරල ගිය නමින් ගීතය හඳුන්වා දීම සඳහා තුඩු දුන් විෂය මූලික මෙන් ම සංස්කෘතිකමය රූපය හඳුනාගැනීමට ද, ඒ මගින් සරල ගියේ ගුණාත්මක ලක්ෂණ හඳුනාගැනීමට ද හැකි වේ. 1950 දශකයේ "සරල ගිය" නමින් වූ හැඳින්වීම කෙරෙහි බල පෑ "ශාස්ත්‍රීය සංගීතය" පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් ද පළමු පරිච්ඡේදයේ දී සිදු කැරේ.

ගුවන්විදුලි සරල ගිය හා බැඳි 1925 - 1959 අතර කාලය තුළ ඉතිහාසය අධ්‍යයනය ආශ්‍රිත කරුණු සාකච්ඡා වන්නේ දෙවැනි පරිච්ඡේදයෙහි ය. එම අධ්‍යයනයේ දී පරිපාලනමය කටයුතු හා ශිල්පීය දායකත්වය යන කරුණු විශේෂයෙන් අවධානයට ලක් වේ.

ගුණාත්මක ලක්ෂණ හඳුනා ගැනුණේ අධ්‍යයනයන් දෙකක් ලෙසිනි. ඉන් එකක් වූයේ සරල ගියේ සාහිත්‍යය හැදෑරීම යි. ගීත පද රචනය හා බැඳි කාලීන ප්‍රවණතා, විවිධ තේමා, පද රචනයේ භාෂාව යන කරුණු මෙහි දී විමර්ශනයට ලක් වේ. තෙවැනි පරිච්ඡේදයෙහි අන්තර්ගත වන්නේ එකී අධ්‍යයනයේ ප්‍රතිඵලය යි.

ගුණාත්මක ලක්ෂණ හඳුනා ගැනීම සඳහා වූ අනෙක් අධ්‍යයනයයේ ප්‍රතිඵල සිව්වන පරිච්ඡේදය මගින් විවරණය කැරේ. මෙහි අරමුණ වන්නේ ගීතයේ සංගීත රචනය විමර්ශනය කිරීම යි. එහි ලා අවධානය යොමු වූ ප්‍රධාන කරුණු තුනක් වේ .

1. උත්තර භාරතීය සංගීතයෙන් ලද ආභාසය
2. බටහිර සංගීතයෙන් ලද ආභාසය
3. දේශීය ජන නාදරටාවලින් ලබා ගත් ආභාසය

පර්යේෂණයෙහි ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනය ඉන් අනතුරු ව දැක් වේ.

උදෘත උපුටා දැක්වීමේ දී අදාළ ලේඛනවල සඳහන් පරිදි ම ඉදිරිපත් කොට ඇත.